# ප්‍රාදේශිය ලේකම්වරයාගේ කාර්යභාරය

- 2002 අංක 24 දරණ සුබසාධක ප්‍රතිලාභ පනතේ 15 වන වගන්තියට අනුව තම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පනතේ 10(1) යටතේ තේරීම් කමිටු /තොරතුරු එක් රැස් කරන නිලධාරීන් ඒ ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාස මට්ටමින් පත් කිරීම, ඔවුන්ගේ කටයුතු අධීක්ෂණය හා පසු විපරම් කිරීම.

- පනතේ 21 හා 22 වගන්ති වලට විශේෂ අවධානය යොමු කරවමින් ඒ පිළිබඳව අදාළ නිලධාරීන්ට මග පෙන්වීම හා එම කටයුතු අධීක්ෂණය කිරීම.

- සුබසාධක ප්‍රතිලාභ පනතේ 8(1) වගන්තිය යටතේ සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් පවරණ විධිවිධාන බලතල සහ කාර්යය හෝ කර්තව්‍යයන් ඉටු කිරීම.

- සුබසාධක ප්‍රතිලාභ පනතේ 12(1) වගන්තිය ප්‍රකාරව විරෝධතා හෝ හිමිකම් පෑම පිළිබඳ විමර්ෂණය කිරීමට සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ නියෝග සහ විධිවිධාන වලට අනුව අභියාචනා කමිටු පත් කිරීමේදී අවශ්‍ය වන ප්‍රජා නායකයින් දෙදෙනෙකුගේ නාමයෝජනා දිසාපතිවරයාට ඉදිරිපත් කිරීම.

- සුබසාධක ප්‍රතිලාභ පනතේ 7(1) වගන්තියට අනුව සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රම කළමනාකරණ කිරීමට සුබසාධක ප්‍රතිලාභ තොරතුරු පද්ධතිය සහ තොරතුරු ඒකකය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම ඒ හා සබැඳි උප කරුණු ක්‍රියාත්මක කිරීම.

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ස්ථාපිත කරන සුබසාධක ප්‍රතිලාභ තොරතුරු ඒකකය සහ එයට අනුයුක්ත සුබසාධක ප්‍රතිලාභී තොරතුරු නිලධාරීන්ගේ කාර්ය පටිපාටිය සුබසාධක පනත සහ මණ්ඩල නියෝග ප්‍රකාරව සිදුවන බවට වගබලා ගැනීම සහ අධීක්ෂණය කිරීම.